**රජයේ නිවේදනයයි**

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

**2 වැනි වගන්තිය යටතේ නියමය**

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය **එම්. යූ.එම්. අලි සබ්රි** වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2021 අප්‍රේල් මස 26 දිනැති අංක 2225/1 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත නියමය 2022 අප්‍රේල් මස 14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මෙම නියමය 2022 අප්‍රේල් මස 14 දින සිට ආරම්භ වන මාස 06 කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

**එම්. යූ.එම්. අලි සබ්රි**
**මුදල් අමාත්‍ය**

2022 අප්‍රේල් මස .....11....... වන දින
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේදීය.

# උපලේඛනය

| 1 වන තීරය | | | | 11 වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 1 | 03.02 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, අළුත් හෝ ශීතකළ මසුන් | 10% හෝ කි. ග්‍රෑමයට රු. 200 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| | 03.03 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, හිමායිත මසුන් (රේගු සං. ව. සංකේතාංක 0303.54 යටතට වැටෙන මැකරල් මසුන් සහ රේගු සංකේතාංක 0303.55 යටතට වැටෙන ජැක් සහ හෝස් මැකරල් (Jack and horse mackerel - *Trachurus spp.*) මසුන් හැර) | 10% හෝ කි. ග්‍රෑමයට රු. 200 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| 2 | | 0305.59.10 | උම්බලකඩ සහ ඒ සඳහා ආදේශක | කි. ග්‍රෑමයට රු. 302.00 |
| 3 | 07.13 | 0713.31.19 | අනෙකුත් - මුං ඇට | කි. ග්‍රෑමයට රු. 40.00 |
| 4 | | 0713.40.11 | සම්පූර්ණ - මයිසූර් පරිප්පු (රතු පරිප්පු) | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 0713.40.12 | පියළිකළ- මයිසූර් පරිප්පු (රතු පරිප්පු) | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 0713.40.21 | සම්පූර්ණ - කහ පරිප්පු | කි. ග්‍රෑමයට ශත 25 |
| | | 0713.40.22 | පියළිකළ - කහ පරිප්පු | කි. ග්‍රෑමයට ශත 25 |
| 5 | 08.04 | 0804.50.50 | මැංගුස්ටීන් - අළුත් | කි. ග්‍රෑමයට රු. 200.00 |
| | | 0804.50.60 | මැංගුස්ටීන් - වියළි | කි. ග්‍රෑමයට රු. 200.00 |
| 6 | 08.10 | 0810.50 | කිවිප්‍රූට් | කි. ග්‍රෑමයට රු. 175.00 |

**Government Notification**

**Special Commodity Levy Act, No. 48 of 2007**

**Order under Section 2**

By virtue of the powers vested in me under Section 2 of the Special Commodity Levy Act No. 48 of 2007, I, M. U.M. Ali Sabry, Minister of Finance of the Democratic Socialist Republic of Sri Lanka, do by this order impose in respect of the commodities specified in Column I of the Schedule hereto a Special Commodity Levy at the rate specified in the corresponding entries in Column II of that Schedule.

The Order made under Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007 and published in the Extraordinary Gazette Notification No. 2225/1 of April 26, 2021 is rescinded with effect from April 14, 2022.

This Order shall be valid for a period of 06 months commencing from April 14, 2022 subject to provisions of Sub Section (3) of Section 2 of the Special Commodity Levy Act, No. 48 of 2007.

**M. U.M. Ali Sabry**
**Minister of Finance**

Ministry of Finance
Colombo 01,
April ..11... 2022

## SCHEDULE

| Column I | | | | Column II |
|---|---|---|---|---|
| Commodity Details | | | | Special Commodity Levy |
| | H. S. Heading | H.S. Code | Description | |
| 1 | 03.02 | | Fish, fresh or chilled, excluding fish fillets and other fish meat of heading 03.04 | 10% or Rs.200.00 per Kg, the amount of levy whichever is higher |
| | 03.03 | | Fish, frozen, excluding fish fillets and other fish meat of heading 03.04 (Other than the Mackerel fish coming under H.S. Code 0303.54 and Jack and horse mackerel - *Trachurus spp.*/ fish coming under H.S. Code 0303.55) | 10% or Rs.200.00 per Kg, the amount of levy whichever is higher |
| 2 | | 0305.59.10 | Maldive Fish and Substitutes thereof | Rs.302.00 per kg |
| 3 | 07.13 | 0713.31.19 | Other – Green gram (Moong) | Rs. 40 per Kg |
| 4 | | 0713.40.11 | Massor dhal (red lentils )- Whole | 25 Cents per kg |
| | | 0713.40.12 | Massor dhal (red lentils )- Split | 25 Cents per kg |
| | | 0713.40.21 | Yellow lentils - Whole | 25 Cents per kg |
| | | 0713.40.22 | Yellow lentils - Split | 25 Cents per kg |
| 5 | 08.04 | 0804.50.50 | Mangoesteens - fresh | Rs. 200 per Kg |
| | | 0804.50.60 | Mangoesteens - dried | Rs. 200 per Kg |
| 6 | 0810 | 0810.50 | Kiwifruit | Rs. 175 per Kg |